192

# නේවාසික ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලය - මී ඔය
# வதிவிட திட்ட முகாமையாளர் காரியாலையம் – மீ ஓய
# Resedent Project Management Office – Mee Oya

වාරිමාර්ග කළමනාකරණ අංශය
நீர்ப்பாசன முகமைத்துவ பிரிவு
**Irrigation Management Division**
වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය
நீர்ப்பாசனம் மற்றும் நீர் முகாமைத்துவ அமைச்சு
**Ministry of Irrigation & Water Resources Management**

මී ඔය
ගල්ගමුව
மீ ஓய
கல்கமுவ
Mee Oya
Galgamuwa

15 FEB 2018

මගේ අංකය / எனது இல. / My Ref No — 018/3/1/3
ඔබේ අංකය / உமது இல. / Your Ref No
දිනය / திகதி / Date — 2017/ 01/ 25

ව්‍යාපාර කළමනාකරණ කමිටු සාමාජික සියලුම
රජයේ නිලධාරි මහතුන් සියලුම ගොවි සංවිධාන
නියෝජිතවරුන් වෙත

**<u>මී ඔය ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීම් වාර්තාව 2018 -ජනවාරි</u>**

සහභාගි වූ නිලධාරීන්

| අනු අංකය | නම | තනතුර | ආයතනය |
|---|---|---|---|
| 01 | D.M.K.H.දිසානායක මයා | නේ:ව්‍යා:කළමණාකරු | වාරිමාර්ග කළමනාකරණ අංශය |
| 02 | H.M.K.C.හේරත් මිය | සංවර්ධන සහකාර | වාරිමාර්ග කළමනාකරණ අංශය |
| 03 | M.N.A.N.කුමාරි මිය | සංවර්ධන නිලධාරි | වාරිමාර්ග කළමනාකරණ අංශය |
| 04 | K.P.K.S.පතිරණ මිය | සංවර්ධන නිලධාරි | වාරිමාර්ග කළමනාකරණ අංශය |
| 05 | J.M.N.S.ජයසූරිය මෙනවිය | සංවර්ධන නිලධාරි | වාරිමාර්ග කළමනාකරණ අංශය |
| 06 | R.M.G.ඒකනායක මයා | කළමණාකරු | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව |
| 07 | H.M.C.B.හේරත් මයා | සහකාර කළමණාකරු | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව |

සහභාගි වූ ගොවි නියෝජිතවරුන්

| අනු අංකය | නම | තනතුර | ගොවි සංවිධානය |
|---|---|---|---|
| 01 | R.D.සෝමරත්න මයා | ලේකම් | ගැමුණු ගොවි සංවිධානය |
| 02 | G.M.කිරිබංඩා මයා | සභාපති | අභය ගොවි සංවිධානය |
| 03 | R.M.නවරත්න මයා | ලේකම් | මහසෙන් ගොවි සංවිධානය |
| 04 | J.A.සියාතුහාමි මයා | සභාපති | වළගම්බා ගොවි සංවිධානය |
| 05 | W.M.කුමාරපාල මයා | ලේකම් | වළගම්බා ගොවි සංවිධානය |
| 06 | H.M.I.P.දිසානායක මයා | සභාපති | පැරකුම් ගොවි සංවිධානය |
| 07 | D.තාහිදු මයා | ලේකම් | ධාතුසේන ගොවි සංවිධානය |
| 08 | H.M.උක්කු බංඩා මයා | සභාපති | යාය 01 ගොවි සංවිධානය |
| 09 | W.M.ජයසූරිය මයා | ලේකම් | යාය 01 ගොවි සංවිධානය |
| 10 | R.M.H.රත්නායක මයා | ලේකම් | යාය 03 ගොවි සංවිධානය |

| | | | |
|---|---|---|---|
| 11 | T.B.හේරත්බංඩා මයා | සභාපති | පුරාණගම ගොවි සංවිධානය |
| 12 | B.M.C.බාලසූරිය මයා | ලේකම් | පුරාණගම ගොවි සංවිධානය |
| 13 | R.I.B.දිසානායක මයා | භාණ්ඩාගාරික | පුරාණගම ගොවි සංවිධානය |

ආගම සිහි කිරීමෙන් අනතුරු ව මී ඔය ව්‍යාපාර කළමණාකාරතුමාගේ ප්‍රධානත්වයෙන් 2018 ජනවාරි මස 25 වන දින පෙ:ව 9:00 ට මී ඔය නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලයේදී ව්‍යාපාර කමිටු රැස්වීම පවත්වන ලදි.පැමිණ සිටි සියලු දෙනා පිළිගැනීමෙන් අනතුරුව න්‍යාය පත්‍රයට අනුව රැස්වීමේ කටයුතු ආරම්භ කරණ ලදි.

<u>පසුගිය කමිටු වාර්තාව සමාලෝචනය හා එකඟතා ලබා ගැනීම</u>

පසුගිය වාර්තාවේ අඩුපාඩු කිසිවක් නොවූයෙන් රැස්වීමේ කටයුතු ඉදිරියට කරගෙන යාමට තීරණය විය.

01.ආයතන සංවර්ධන කටයුතු- සංවර්ධන සහකාර

- ❖ පසුගිය මාසයේ ප්‍රගතිය

| අනු අංකය | කාරණය | ප්‍රගතිය |
|---|---|---|
| 01 | කාරක සභා පැවැත්වීම | 14 |
| 02 | මුදල් සාරාංශ ලබා දීම | 16 |
| 03 | අවසන් ගිණුම් සැකසීම | 16 |

- ❖ ඉදිරි මාසයේදී පැවැත්වීමට අපේක්ෂිත මහ සභා /කාරක සභා

| කාරණය | ඉලක්කය | වගකීම |
|---|---|---|
| මහ සභා පැවැත්වීම | 01 | නේ:ව්‍යා:කළ/සං:සහ/ සං:නි |
| කාරක සභා පැවැත්වීම | 16 | එම |
| මුදල් සාරාංශ ලබා දීම | 16 | එම |

- ➢ ගිණුම් යථාවත් කිරීම සියළු ගොවි සංවිධානවල සතුටුදායක මට්ටමක පවතින බවත් මේ වන විට අවසන් ගිණුම් සකස් කිරීම ද අවසන් අතර වාර්ෂිකව සිදු කරන බාහිර විගණනය සඳහා පොත් පත් සහ අදාළ ලේඛන සූදානම් කර ගන්නා ලෙසත් පවසන ලදි.
- ➢ පසු ගිය වසරේ දී මාසික රැස්වීම් පැවැත්වීම පිළිබඳව අදහස් දක්වමින් පාළුකඩවල යාය 01සහ යාය 06 යන ගොවි සංවිධාන දුර්වල මට්ටමක පවතින බව පැවසුවා ය.
- ➢ මෙම වසරේ ජූනි සහ ජූලි මාස වලදි පැවැත්වීමට නියමිත නිළවරණ පිළිබඳව ද දැනුවත් කළාය.
- ➢ අතරගල්ල වළගම්බා ගොවි සංවිධානයේ අත ඉතිරිය නියමිත ප්‍රමාණයට වඩා වැඩි බවත් ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදු කළ යුතු බවත් පැවසීය.

නේවාසික ව්‍යාපාර කළමණාකරු

- ගොවි සංවිධාන සාමාජික ලේඛනය යථාවත් කළ යුතු බවත් එහි දී ඉඩම්හිමි නිත්‍ය සාමාජික ලේඛනය පවත්වා ගත යුතු බවත් පැවසීය.
- අත ඉතිරිය ප්‍රමාණයට වඩා වැඩි බවට ඉහතින් සඳහන් කළ අතරගල්ල වළගම්බා ගොවි සංවිධානයට ලිඛිතව දැනුම් දිය යුතු බව දැනුවත් කරන ලදි.
- නඩත්තු ගිණුම් සහ ගොවි සංවිධාන ගිණුම් හඳුනාගත යුතු බව සංවර්ධන මුදල් සහ වාරිමාර්ග නඩත්තු මුදල් නඩත්තු ගිණුමට බැර කළ යුතු බවත් කොන්ත්‍රාත් මුදල් සහ අනෙකුත් ලැබීම් වෙනත් ගිණුමකට බැර කළ යුතු බවත් පවසන ලදි.
- නඩත්තු ගිණුමෙන් මුදල් නිදහස් කර ගැනීම සඳහා මහ සභා අනුමැතියක් අවශ්‍ය බවට ප්‍රධාන කාර්යාලයෙන් දැනුවත් කර ඇති බවත් පවසන ලදි.
- වාරි පද්ධතියේ නඩත්තු පිළිබඳව ගැටළුකාරී තත්වයක් මතු වී ඇති බවත් කන්න වගා කටයුතු සිදු නොකළත් වාරි පද්ධතිය නඩත්තු කිරීම නිරතුරුව සිදු කළ යුතු බවත් මේ වන විට තණකොළ කැපීම සඳහා නවීන යන්ත්‍රයක් හඳුන්වා දී ඇති බවත් ඒ සඳහා ඉන්ධන වියදම ගොවි සංවිධානය විසින් දැරිය යුතු බවත් ප්‍රකාශ කළේය.
- මීට අමතරව වගාකන්නය සිදු කළත් නොකළත් නඩත්තු මුදල් ගෙවීම සිදු කළ යුතු බවට වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් යෝජනා කළ යුතු බව පවසන ලදි.

ගොවි සංවිධානවල අදහස්

- මූලිකවම නඩත්තු ගිණුම් ආරම්භ කළ අපේක්ෂාව පැහැදිලි කරමින් ගං වතුර හානි ආදියේ දී ප්‍රයෝජනයට ගැනීම සඳහා නඩත්තු ගිණුම ආරම්භ කළ බව පැවසීය.සංවර්ධන මුදලින් කොටසක් පමණක් නඩත්තු ගිණුමෙහි තැන්පත් කර ඉතිරිය ලංකා බැංකු ගිණුමට බැර කිරීම සුදුසු බවටත් අදහස් දැක්වීය.

02. වෙනත් ආයතන :-
කළමණාකරු ප්‍රාදේශීය සංවර්ධන බැංකුව - අඹන්පොළ

- මේ වන විට වාරි පුබුදු ණය ලබා ගෙන වාරික නොගෙවා පැහැර හැර ඇති අතරගල්ල පැරකුම් ගොවි සංවිධානයට අයත් ගොවි මහත්මියක් සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියා මාර්ගය පිළබඳව විමසීම් කරණ ලදි.
- ඉදිරියේ දී ප්‍රාදේශීය සංවර්ධන බැංකුවෙන් වාරි පුබුදු ණය වැඩසටහන යටතේ යම් ගොවි මහතකු ප්‍රාදේශීය සංවර්ධන බැංකුවෙන් ණය ලබා ගන්නේ නම් එක් ණයක් සඳහා ගනු ලබන ණය මුදලෙන් 0.5% ප්‍රතිශතයක් ගොවි සංවිධානයට ලැබෙන පරිදි ඉදිරියේදී කටයුතු කිරීම සුදුසු බවත් ඒ තුලින් ගොවි සංවිධානයටද යම් මුදලක් ලැබෙන බවත් පෙන්වා දෙන ලදි.

ණය නොගෙවීම සම්බන්ධව ගොවි සංවිධානයේ කාරක සභා රැස්වීමක් පවත්වා නීතිමය කටයුතු සඳු කිරීම සඳහා අවශ්‍ය නිර්දේශයක් නේවාසික ව්‍යාපාර කළමණාකරු මගින් බැංකුව වෙත ලබා දෙන ලෙස **නේවාසික ව්‍යාපාර කළමණාකරු** දැන්වීය

අද දින පවත්වන ලද ව්‍යාපාර කමිටුව සාර්ථකව පැවැත්වීම සඳහා සහයෝගය දුන් සියලු දෙනාටම ස්තූතිවන්ත වෙමින් ප:ව 12.30ට පමණ ව්‍යාපාර කමිටුව අවසන් කළ අතර මීලග ව්‍යාපාර කමිටු රැස්වීම 2018 පෙබරවාරි මස 15 වන දින පෙ:ව 9.00ට නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලයේදී පැවැත්වෙන බවටද සභාව දැනුවත් කරමින් නේවාසික ව්‍යාපාර කළමණාකාරතුමන් විසින් රැස්වීමේ කටයුතු අවසන් කරණ ලදි.

නේවාසික ව්‍යාපාර කළමණාකරු
මී ඔය/උස්ගල සියඹලන්ගමුව ව්‍යාපාරය

[illegible] දිසානායක
නේවාසික ව්‍යාපාර කළමනාකරු
මීඔය/උස්ගල සියඹලන්ගමුව ව්‍යාපාරය,
ගල්ගමුව.

පිටපත්:-
01.දිස්ත්‍රික් ලේකම් කුරුණෑගල :-කාදැස
02.වාරිමාර්ග කළමනාකරණ අංශය කොළඹ :- කාදැස
03.දිස්ත්‍රික් වාරිමාර්ග අධ්‍යක්ෂ කුරුණෑගල :-අවශ්‍යකටයුතු සඳහා
04.ප්‍රාදේශීය ලේකම් ගල්ගමුව/අඹන්පොල/ඇහැටුවැව :-අවශ්‍ය කටයුතු සඳහා
05.ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු ගල්ගමු :-අවශ්‍ය කටයුතු සඳහා
06.ගොවිජන සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස් කුරුණෑගල :-අවශ්‍ය කටයුතු සඳහා
07.ගොවිජන සංවර්ධන නිලධරි ගල්ගමුව/අඹන්පොල
ඇහැටුවැව/නාන්නේරිය :-අවශ්‍ය කටයුතු සඳහා
08.සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ ගල්ගමුව කලාපය :-අවශ්‍ය කටයුතු සඳහා
09.සහකාර අධ්‍යක්ෂ කෘෂි රක්ෂණ මණ්ඩලය මහව :-අවශ්‍ය කටයුතු සඳහා
10.කෘෂිකර්ම උපදේශක පාලුකඩවල/අඹන්පොල
වන්නි ඉහලගම/ඇහැටුවැව/නාන්නේරිය :-අවශ්‍ය කටයුතු සඳහා
11.සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ගල්ගමුව :-අවශ්‍ය කටයුතු සඳහා